දිවි තොරකර ගැනීම් වාර්තා කිරීමේදී වගකීම් සහගත වන ලෙසින් මාධ්‍ය මාර්ගෝපදේශයන් උපදෙස් දෙන ප්‍රධානතම හේතුව වන්නේ, අනුකාරක දිවි තොර කර ගැනීම් සිදුවීම වළක්වා ලීම සඳහා වේ.

වගකීම් සහගතව දිවි තොර කර ගැනීමක් වාර්තා කිරීමේදී යෝග්‍ය එක් භාවිතයක් වන්නේ, දිවි තොර කර ගැනීම සම්බන්ධ සන්දර්භය අතිසරල කොට නොදැක්වීමයි. එනම්, යම් සරල හේතුවක් නිසා එය සිදුවූ බවක් නොදැක්වීමයි. එය, ඒ හා සමාන තත්වයක් අත්දකින අයෙකුට දිවි තොර කර ගැනීමක් අනුකරණය කිරීමට උත්තේජනයක් සැපයිය හැක.

එසේම, දිවි තොර කර ගැනීම් වැළැක්වීමේ හදිසි උපකාරක අංක මගින්, ඊට නැඹුරුතාවයක් ඇතිව සිටින අයෙකුට අවශ්‍ය උපදේශනය ලබා දීමටත්, ඒ ඔස්සේ එම තැනැත්තාගේ ජීවිතය බේරා ගැනීමටත් ඉඩක් ලැබිය හැකි නිසා, දිවි තොර කර ගැනීම් සම්බන්ධ පුවත් වාර්තාවන් සමඟින් සෑමවිටම හදිසි උපකාරක අංක පළ කිරීම යෝග්‍ය වේ.

එසේම දිවි තොර කර ගැනීමක් සිදුවූ ආකාරය නොදැක්වීමත්, දිවි තොර කරගත් අයෙකුගේ ඡායාරූප දැක්වීමේදී ප්‍රවේසම් වීමත් එලෙසින්ම අවශ්‍ය වේ.

යාපනයේ වඩමාරච්චි ප්‍රදේශයේ අවුරුදු 14 ක පාසැල් සිසුවෙකු ජනවාරි 30, 2024 දින දිවි තොර කර ගැනීමේ පුවත ඇතැම් මාධ්‍ය තුළ ආවරණය වී ඇති ආකාරය සලකා බැලිය හැක.

මෙම ප්‍රවෘත්තිය වඩාත් වගකීම් සහගත ලෙසින් පළ කිරීමේ හැකියාවක් නොතිබුණි ද?

උපකාරක අංක පළ කරමු, ජීවිතයක් රැකගනිමු!

හදිසි උපකාරක අංක:

*CCCline - 1333

*ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308

*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක).

මූලාශ්‍ර :


https://media.samaritans.org/.../Media_Guidelines_FINAL.pdf

https://iris.who.int/.../258814/WHO-MSD-MER-17.5-eng.pdf

https://mindframe.org.au/news/the-importance-of-including-help-seeking-in-news-articles


